*Sinhala*

# රෙදිපිළි, ඇඟළුම් සහ ඇඳුම් කර්මාන්තයේ ජෝර්දාන පුරවැසියන් නොවන සේවකයින් සඳහා සම්මත ගිවිසුමකි

ජෝර්දාන ඇඟළුම්, උපාංග සහ රෙදිපිළි අපනයනකරුවන්ගේ සංගමය, ඇඟළුම් කර්මාන්ත ශාලා හිමිකරුවන්ගේ පොදු සංගමය සහ රෙදිපිළි, ඇඟළුම් සහ ඇඳුම් කර්මාන්තය තුළ සේවකයින්ගේ පොදු වෘත්තීය සමිති සංගමය අතර 2013.05.28 දින අත්සන් කරන ලද අංක 39/2013 දරණ සාමුහික ගිවිසුමේ 15 වන වගන්තිය අනුව නිකුත් කරන ලදී.

**ජෝර්දාන ඇඟළුම්, උපාංග සහ රෙදිපිළි අපනයනකරුවන්ගේ සංගමය (JGATE)**

**ඇඟළුම් කර්මාන්ත ශාලා හිමිකරුවන්ගේ පොදු සංගමය**

**ඇඟළුම් සහ ඇඳුම් කර්මාන්තය තුළ සේවකයින්ගේ පොදු වෘත්තීය සමිති සංගමය**

**පළමු පාර්ශ්වය:**

සේවා යෝජක: ..........................................................................

නියෝජිත: ..............................................................මයා/මිය/මෙනවිය

ලිපිනය: ....................................................................................................

දුරකථන අංකය.: ....................................................................................................

**දෙවන පාර්ශ්වය:**

සේවකයාගේ සම්පූර්ණ නම:....................................................................................................

උපන් දිනය: (දිනය ............... / මාසය............... / වර්ෂය .......... .....)

ජාතිය:....................................................................................................

ගමන් බලපත්‍ර අංකය :....................................................................................................

ලිපිනය: ....................................................................................................

දුරකථන අංකය.: ....................................................................................................

මෙම ගිවිසුම යටතේ, පහත සඳහන් නියමයන් සහ කොන්දේසිවලට අනුකූලව නිශ්චිත වැටුපක් ලබාගැනීම වෙනුවෙන් පළමු පාර්ශවයේ (මෙහි මින්මතු සේවා යෝජකයා වශයෙන් සඳහන් වන) අධීක්ෂණය සහ කළමනාකාරිත්වය යටතේ දෙවන පාර්ශ්වය (මෙහි මින්මතු සේවකයා වශයෙන් සඳහන් වන) විසින් පළමු පාර්ශ්වය සඳහා සේවයේ යෙදෙන බවට දෙපාර්ශවය විසින් එකඟ වේ:

We Certify the Accuracy of the Translation
Tel: (962-6) 5100 900 – Fax: (+962-6) 5100 901
translation.amman@tagtdp.com

## 1. සේවා ගිවිසුම:

සේවා ගිවිසුම අරාබි භාෂාවෙන් සහ සේවකයාට අවබෝධ කරගත හැකි වෙනත් භාෂාවකින් කෙටුම්පත් කරනු ලබන අතර, සේවා යෝජකයා සහ සේවකයා විසින් අත්සන් කරනු ලබන මුල් පිටපත් තුනකින් සමන්විත වේ. දෙපාර්ශ්වය විසින්ම මුල් පිටපතක් තමන් සතුව පවත්වා ගත යුතු

අතර, තෙවන පිටපත සේවා බලපත්‍ර නිකුත් කිරීම සඳහා කම්කරු අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

**2. ගිවිසුමේ කාලය:**
කම්කරු අමාත්‍යාංශය විසින් අනුගමනය කරන ක්‍රියාපටිපාටියට අනුකූලව සේවා බලපත්‍රය නිකුත් කිරීම සැලකිල්ලට ගනිමින් ගිවිසුමේ කාලය ................................ බවට දෙපාර්ශවය විසින් එකඟ වේ. ඒ අනුව, ගිවිසුමේ කාලය ජෝර්දාන් හැෂ්මිට් රාජධානිය (මෙහි මින්මතු ජෝර්දානය වශයෙන් සඳහන් වන) ට සේවකයා පැමිණි දින සිට ආරම්භ වන අතර, සේවා යෝජකයා සෙවකයාට අවශ්‍ය විසින් සේවකයාට අවශ්‍ය නේවාසික සහ සේවා බලපත්‍ර නිකුත් කිරීම සඳහා අවශ්‍යවන නීතිමය අවශ්‍යතාවන් සපුරාලිය යුතුය.

**3. රැකියා විස්තරය සහ සේවා ස්ථානය:**

අ. සේවකයා විසින් .......................වෘත්තියෙහි සේවය කළ යුතු අතර, සේවාවේ ස්වභාවය අනුව සහ සේවා යෝජකයා හෝ ඔහුගේ / ඇයගේ නියෝජිතයාගේ උපදෙස් අනුව තම රාජකාරි සහ වගකීම් ඉටු කිරීමට බැඳී සිටී.

ආ. සේවකයාගේ සේවා ස්ථානය .......................... ප්‍රදේශයේ පිහිටි සේවා යෝජකයාගේ ස්ථානය වේ. එසේවුවද, කම්කරු අමාත්‍යාංශයේ අනුමැතිය ලැබීමෙන් පසු සහ සේවකයාගේ මූල්‍ය හිමිකම්වලට හානියක් නොවන පරිදි (ස්ථාන මාරුවට) සතියකට පෙර ලිඛිතව දැනුම් දීමකින් පසු ජෝර්දානය තුළ තම ව්‍යාපාරයේ වෙනත් ශාඛාවකට ස්ථාන මාරු කිරීමට සේවා යෝජකයාට බලය ඇත.

**4. සේවා නියුක්තිය සහ ගමන් සංවිධානය කිරීම:**

ඇ. සේවා යෝජකයා විසින් සේවකයාගේ ගමන් සංවිධානය කිරීම ඇතුළුව සේවා නියුක්ති ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා වගකීමට බැඳී සිටී. සේවකයා විසින් ඔහුගේ / ඇයගේ රටේදී ගෙවිය යුතු නීතිමය ගාස්තු හැර අයකිරීම් හෝ ගාස්තුවලට යටත් නොවේ. එමෙන්ම, ඔහුගේ/ ඇයගේ රටේදී ගෙවිය යුතු නීතිමය ගාස්තු හැර වෙනත් ගාස්තු ගෙවීමට සේවකයා බැඳී නොමැති බවට ඔහු/ ඇය දැනුවත් වී ඇති බව සේවකයා විසින් සහතික විය යුතුය.

ආ. සේවා යෝජකයා විසින්:

1. සේවකයා ජෝර්දානයට පැමිණි අවස්ථාවේදී සුදුසු පරිදි පිළිගෙන ඔහුගේ/ ඇයගේ සේවා ස්ථානයට කිසිදු ගාස්තුවක් නොමැතිව ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය වන සියලුම කටයුතු සූදානම් කළ යුතුය.
2. සේවා යෝජකයා විසින් සේවකයාට සේවා නියුක්තිය මත ඔහුගේ/ ඇයගේ රටේ සිට ජෝර්දානයට නොමිලේ ගුවන් ගමන් බලපත්‍ර ලබාදිය යුතු අතර, සේවා ගිවිසුම අවසානයේදී හෝ මෙම ගිවිසුමේ 5/ආ/3 පරිච්ඡේදයට යටත්ව සේවා සම්බන්ධතාවය අවසන් කිරීම මත ඔහුගේ/ ඇයගේ රටට ආපසු යාමට නොමිලේ ගුවන් ගමන් බලපත්‍ර ලබාදිය යුතුය.
3. සේවා ගිවිසුමේ සම්පූර්ණ කාලය ඉකුත්වීමට පෙර සේවකයා විසින් නීති විරෝධිව සේවා සම්බන්ධතාවය අවසන් කරන්නේනම්, ජෝර්දානයේ සිට සේවකයාට ඔහුගේ/ ඇයගේ රටට ආපසු යාම සඳහාවන ගුවන් ගමන් බලපත්‍රයේ මුළු පිරිවැය ආවරණය කිරීමට සේවා යෝජකයා බැඳී නොමැත. එවැනි අවස්ථාවකදී, සේවා ගිවිසුමෙන් සම්පූර්ණ කාලයෙන් ඔහු සැබැවින්ම සේවය කළ කාලයට සමානුපාතික වියදමක් ආපසු යාම සඳහාවන ගුවන් ගමන් බලපත්‍රය වෙනුවෙන් සේවා යොජකයා විසින් දැරිය යුතුවේ.

Certify the Accuracy of the Translation
translation.amman@tagtdp.com